# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 20 දරන
# පැලෑටි ආරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 අගෝස්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1986 අගෝස්තු මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක**

මිළ : ශත 30 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 20 දරන පැළෑටි ආරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 අගෝස්තු මස 06 වන දින]

එල්. ඩී.—ඕ. 77/84

## පැළෑටි ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 20 දරන පැළෑටි ආරක්ෂක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

2. 1957 අංක 50 දරන පනතින් සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පැළෑටි ආරක්ෂක ආඥාපනතේ, 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

*447 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) "රෝගය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

'"රෝගය" යන්නට, පැළෑටිවලට හෝ ශාක නිෂ්පාදනවලට හානිකර හෝ හානි පැමිණවීමේ ශක්‍යතාවක් ඇති යම් ශාකමය හෝ සත්වමය ජීවියකු විසින් නැතහොත් යම් ව්‍යාධිජනක කාරකයක් විසින් සිදු කරනු ලබන සියලු ආබාධ ඇතුළත් වේ.'

(2) "අයිතිකරු" හෝ "බුක්තිකරු" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්:—

'"අයිතිකරු" හෝ "බුක්තිකරු" යන්නට යම් වගාකළ හෝ වගා නොකළ ඉඩමක, හිමිකරු, බදුගැනුම්කරු, අධිකාරීවරයා හෝ එහි තථ්‍ය භාරය ඇතිව සිටින වෙනත් යම් තැනැත්තකු හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතේ අර්ථානුකූලව යම් ගොවියකු, බුක්තිකරුවකු හෝ ඉඩම් හිමි ගොවියකු ඇතුළත් වේ;'

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ "විනාශ කිරීම සඳහා සහ නිසි ලෙස බැහැර කිරීම සඳහා" යන වචන වෙනුවට "ගිනි තැබීමෙන් හෝ අන්‍යාකාරයෙන් විනාශ කිරීම සඳහා සහ නිසි ලෙස බැහැර කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් සහ

(2) එම උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

'(ඒඒ) රෝගග්‍රස්ත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද යම් ප්‍රදේශයක, ගිනි තැබීමෙන් විනාශ කරන ලද යම් භෝගයක් වගා කිරීම අවම වශයෙන් එක් මාසයක කාල සීමාවක් සඳහා තහනම් කිරීම සඳහා;'.

089489—7,275 (86/03)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.